## 2018 ජූලි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"රන්වත් රිදීවත් මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි. නාසරෙත් හි ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න"**

(ක්‍රියා 3:6)

අයැදීමේ සේවකයන් වශයෙන්, ඔබටත් / මටත් අයැදීමට සහ මැදිහත් වීමට ශුද්ධාත්මයාණෝ බොහෝ දේ සිහිකර දෙන සේක. අන් අය වෙනුවෙන් අපි බැගෑ සිතින් කරන අයැදීම් අබ්බා පියාණන් වහන්සේ කිසිදා අහක දමන්නේ නැත. අන්‍යාගාමිකයන් මෙන් අපි ඉල්ලා සිටිය යුත්තේ ලෞකික දේට වඩා ලෝකෝත්තර දේය. අද සුපුවත තුළ උපන්දා සිට කොරව සිටි මනුෂ්‍යයෙකුව සුදර්ශන නම් දොරටුව ළග තබා ඇත්තේ, ඔහුගේ අසරණකම හා ඔහුගේ යාදිනි අසා අනුකම්පා සිත් ඇති අය ඔහුට දෙන මුදල් සිඟන්නාගේ ප්‍රයෝජනයට වඩා ඔහුව හිඟමනට යොදවන අයගේ අවශ්‍යතා සපුරා ගැනීමට බව මැනවින් වටහා ගත හැක. අද සමාජය තුළත් මෙවැනි අසරණයන්ව උපයෝගි කරගෙන මුදල් හම්බ කරගන්නා ජාවාරම් කාරයෝ බොහෝය.

පේදුරු තුමා සහ ජුවාම් තුමා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වෙමින් අන් අය කරනවා වගේ මුදල් දී ඔහුව තාවකාලිකව සනසනවාට වඩා ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ඔහුව සුවපත් කිරීම දේව කැමැත්ත විය. එතුමන්ලාගේ විශ්වාසය නිසා ඔහු තුළ ප්‍රාතිහාර්යක් සිදු විය.

අයැදීමේ සේවකයන් වශයෙන් මනුෂ්‍යයන්ගේ තාවකාලික අවශ්‍යතා සපයා දීමට අයදිනවාට වඩා ඒ සියළු දේ හරහා ආධ්‍යාත්මික වටිනාකම් තුළ ජීවත් වීමට අවැසි දේ වෙනුවෙන් අයැදීම අපගේ මූලික දූත කාර්ය යි.

එබැවින් මෙම මාසය පුරාවටම ලෞකික දේ කරා හඹා යන කිතුනුවන්ට කිතුනු වටිනාකම් තුළ ජීවත් වීමට අවැසි ශුද්ධාත්ම බලය පතා යාච්ඤා කරමු. මැදිහත් වෙමු.

> **"සැමවිට ම මුළු සිතින් යාච්ඤාවේ ද, අයැදීමේ ද යෙදී සිටින්න.**
> **ආත්මයාණන් වහන්සේගේ බලයෙන් යාච්ඤා කරන්න.**
> **මේ කරුණ නිසා නිතර අවදිව නොකඩවා දෙවියන් වහන්සේගේ**
> **සියළු සෙනඟ උදෙසා යාච්ඤා කරන්න. "** (එපීස 6:18)

පළමු සතිය : දිව්‍යමය කියවීම - ක්‍රියා 3:1-10

අයැදීමට විශේෂ යොමුව :

දේව කැමැත්තට ඉඩ නොදී ලෞකික අවශ්‍යතා මුල් කරගෙන විවිධ දෙවි දේවතාවන්ගේ සරණ පතා යන සියළුම කිතුනුවන් වෙනුවෙන් (විනාඩි 05ක් පමණ)

වෙනත් අයැදීම් :

* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* අන්ධ, ගොළු, බිහිරි, කොර වූ, ඔත්පල වූ අය වෙනුවෙන්.
* පිලිකා, වකුගඩු රෝග, හෘදයාබාධ ඇති සියළු දෙනා වෙනුවෙන්.
* මත්පැන්, මත් ද්‍රව්‍යට සහ විවිධාකාර අපචාර ක්‍රියාවලට ඇබ්බැහි වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* ජූලි 13-14 ප්‍රශංසාරාමයේ පැවැත්වෙන තරුණ ඥානකාන්තියට සම්බන්ධ වන සියළුම තරුණන් වෙනුවෙන් සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

දෙවන සතිය : දිව්‍යමය කියවීම - රෝම 8:18-25

අයැදීමට විශේෂ යොමුව :

පුබුදු දිවිය ගත කර අද පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්

(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* පාසල් දරුවන් සහ ගුරුවර - ගුරුවරියන් වෙනුවෙන්.
* වෛද්‍යවරුන්, සාත්තු සේවක සේවිකාවන් සහ නිවාසවල ඔත්පලව සිටින රෝගීන් බලා ගන්නා අය වෙනුවෙන්.
* ස්වභාව ධර්මයට විරුද්ධව කටයුතු කරන සියළු දෙනා වෙනුවෙන්.
* ජූලි මස 14 වන දින ප්‍රශංසාරාමයේ පැවැත්වෙන සුරුළි වාර්ෂික දිනය වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

තෙවන සතිය : දිව්‍යමය කියවීම - ශු.මතෙව් 7:1-6

අයැදීමට විශේෂ යොමුව :

අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා වෙනුවෙන් (විනාඩි 05ක් පමණ)

වෙනත් අයැදීම් :

* අල්පේච්ඡ සරල ජීවිත ගත කිරීමට සියළු පුබුදු ජනතාවට අවැසි ප්‍රඥාව ලැබෙන පිණිස.
* පවුල් ජීවිතවල විවිධ අර්බුදයන්ට මුහුණ දෙන සියළු දෙනා වෙනුවෙන්.
* විදේශ රටවල පුබුදු සංඝයන් හා එහි වගකීම ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* විවාහ වී දරුවන් නොමැතිව සිටින සියළුම යුවල් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

සතරවන සතිය : දිව්‍යමය කියවීම - පිලිප්පි 4:4-9

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :

* සුදු මුදු සරල චාම් විවාහ කළ සියළුම යුවල් සහ ඔවුන්ගේ දරුවන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

සැළකිය යුතුයි :

සිකුරාදා දිනය යාච්ඤාවේ සහ භාවනාවේ දිනයක් ලෙස ගත කරන්න උත්සාහ කරන්න. එදින තමාට පහසු ලෙස කාලසටහනක් සකස් කරගෙන තම නිවස තුළම හෝ දේවස්ථානයක, පුබුදු මධ්‍යස්ථානයක නිහඬව නිරාහාරව යැදුමෙන් දිනය ගත කරන්න. එදින මගේ පැය, නිරන්තරව ශුද්ධාත්මයාණන්ට අවදිවීම, දිව්‍ය පූජාව, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ පෙනී සිටීමට ප්‍රමුඛතාවය දෙන්න.

| | | |
|---|---|---|
| උදා: පෙ.ව.05.00 - 06.00 | මගේ පැය | |
| | දිව්‍ය පූජාවට සහභාගි වීම ගැන, දිනයට අදාළ දේව වචනය කියවා ආත්මගත කර ගැනීම. | |
| ප.ව.12.00 | ජපමාලය උච්ඡාරණය කිරීම. | |
| ප.ව.06.00 | යාච්ඤා දිනය අවසන් කිරීම | |

හැකිනම් මෙදින රාත්‍රියේ පවුලේ අය එකතු කරගෙන ජපමාලය උච්ඡාරණය කරන්න.

පස් වැදෑරුම් අත්දැකීම :

1. ශුද්ධාත්මයාණන් වහන්සේ මා තුළ ද මා සමඟ ද නතර වී සිටින සේක.
2. ශුද්ධාත්මයාණන් වහන්සේ මුළු විශ්වයෙහිම වැඩ වසති.
   (ස්වභාව දහම, සුළඟ තුළ, ස්පර්ශය තුළ) 'රූ-ආහ්' මම - අප ශුද්ධාත්මයාණන් තුළ
3. ශුද්ධාත්මයාණෝ අප මෙහෙයවන තැනැන් වහන්සේය.
4. පියාණන් වහන්සේගේ හඬ ශුද්ධාත්මයාණෝය.
5. ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬ හරහා පැමිණෙන වචනය ක්‍රිස්තුන් ජේසුස් වහන්සේය.

**" ඔබ කිසිවක් ගැන කරදර නොවී, සියල්ලෙහි දී ස්තුති පූර්වකව යාච්ඤාවෙන් හා කන්නලව්වෙන් ඔබගේ අයැදීම් දෙවියන් වහන්සේට දන්වන්න. එවිට සියළු නැණ නුවණ ඉක්මවා යන දෙවියන් වහන්සේගේ සාමදානය, ක්‍රිස්තුන් ජේසුස් වහන්සේ තුළින් ඔබගේ සිතුම් පැතුම් ආරක්ෂා කරන්නේය."** (පිලිප්පි 4:6-7)

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

******************************